මහෙස්ත්‍රාත් අධිකරණය
අනුරාධපුරය.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 22 දරන ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන රාජ්‍ය සංස්ථා බවට පරිවර්තනය කිරීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 1987 මැයි මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 මැයි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 90 යි · තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1987 අංක 22 දරන ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන රාජ්‍ය සංස්ථා බවට පරිවර්තනය කිරීමේ පනත

**[සහතිකය සටහන් කළේ 1987 මැයි මස 15 වන දින]**

එල්. ඩී.—ඕ. 44/82

**1971 අංක 35 දරන ව්‍යාපාර ආයතන (අත්පත් කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව විසින් අත්පත් කර ගන්නා ලද ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන රාජ්‍ය සංස්ථා බවට පරිවර්තනය කිරීම සඳහා සහ ඊට අදාළ වූ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මෙම පනත 1987 අංක 22 දරන ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන රාජ්‍ය සංස්ථා බවට පරිවර්තනය කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** (1) 1971 අංක 35 දරන ව්‍යාපාර ආයතන (අත්පත් කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව විසින් අත්පත් කර ගන්නා ලද හෝ ආණ්ඩුව සතුකර ගන්නා ලද යම් ව්‍යාපාර ආයතනයක් බාර ගැනීමේ හෝ කරගෙන යාමේ කාර්ය සඳහා සංස්ථාවක් පිහිටුවීම අවශ්‍ය වේ යයි අමාත්‍ය මණ්ඩලය සලකන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් (මෙහි මින් මතු "සංස්ථාගත කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්— — ආණ්ඩුවට පවරාගත් ව්‍යාපාර ආයතන කරගෙන යාම සඳහා සංස්ථා පිහිටුවීම.

(i) සංස්ථාගත කිරීමේ නියමය අදාළ වන්නා වූ ව්‍යාපාර ආයතනය නිශ්චිතව සඳහන් කිරීම;

(ii) ඒ ව්‍යාපාර ආයතනය බාර ගැනීමේ සහ කරගෙන යාමේ කාර්ය සඳහා සංස්ථාවක් පිහිටුවිය යුතු යයි ප්‍රකාශ කිරීම;

(iii) සංස්ථාවට සංස්ථා නාමයක් පැවරීම;

(iv) සංස්ථාවේ පරමාර්ථ නිශ්චිතව සඳහන් කිරීම;

(v) සංස්ථාවේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය සඳහන් කිරීම;

(vi) ව්‍යාපාර ආයතනයේ වත්කම් සැලකිල්ලට ගෙන සංස්ථාවේ මූලික ප්‍රාග්ධනය නිශ්චිතව සඳහන් කිරීම සහ ඒ ප්‍රාග්ධනය විවිධ පංතිවල කොටස්වලට බෙදීම;

(vii) සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව නියම කිරීම, එසේ නියම කරනු ලබන සංඛ්‍යාව පස් දෙනකුට නොවැඩි සහ තුන් දෙනකුට නොඅඩු විය යුතු ය;

(viii) මේ පනතේ විධිවිධාන අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ පළමු වන සාමාජිකයන් පත් කිරීම;

(ix) මේ පනතේ විධිවිධාන අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ පළමු වන සභාපතිවරයා පත් කිරීම;

(x) අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වල ගණපූරණය නිශ්චිතව සඳහන් කිරීම

කරනු ලැබිය හැකි ය.

2—ඒ ෙ 92341—7,265 (86/08)

(2) සංස්ථාගත කිරීමේ නියමය ගැසට් පත්‍රයේ පළකරන ලද විට, තත් කාලයෙහි සංස්ථාවේ සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් සමන්විත වන්නා වූ, ඒ නියමයේ නිශ්චිතව සඳහන් කරන ලද සංස්ථා නාමය සහිතව සහ අවිච්ඡින්න පැවැත්මක් සහිත (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් පිහිටුවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාගත කිරීමේ නියමයෙහි නිශ්චිතව සඳහන් කරන ලද මූලික ප්‍රාග්ධනය, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසු සහ සංස්ථාගත කිරීමේ නියමය ගැසට් පත්‍රයෙහි පළකරන ලද දින යට පෙරාතුවම වූ දිනයෙහි පැවැති සංස්ථාවෙහි වත්කම්වල සහ බැරකම්වල අගය සැළකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු ය.

(4) සංස්ථාව විසින් එහි සංස්ථා නාමයෙන් නඩු පැවරීම සහ ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම කරනු ලැබිය හැකි ය.

ව්‍යාපාර ආයතනය සංස්ථාව වෙත සතු කිරීම.

3. (1) (මේ වගන්තියෙහි "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාගත කිරීමේ නියමය ගැසට් පත්‍රයේ පළකරන ලද දිනයේ සිට සංස්ථාගත කිරීමේ නියමය අදාළ වන ව්‍යාපාර ආයතනය, ඒ සංස්ථාගත කිරීමේ නියමයෙන් පිහිටුවන ලද සංස්ථාව වෙත පරම වශයෙන් සතු විය යුතු ය.

මේ වගන්තියේ කාර්යයන් සඳහා "ව්‍යාපාර ආයතනය" යන්නෙන්—

(අ) අදාළ දිනයට පෙරාතුවම වූ දිනයේ දී ඒ ආයතනයේ කාර්ය සඳහා භාවිත කරන සහ රාජ්‍යය සතු වූ චංචල හෝ නිශ්චල සියලු දේපළ ද ;

(ආ) ඒ දේපළවලින් හෝ ව්‍යාපාරයෙන් ඇතිවන හෝ පැන නගින සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද සහ සම්බන්ධතා සහ ඒ ආයතනයේ සියලු බැරකම් ද ;

(ඇ) ව්‍යාපාර ආයතනයට හෝ ඒ ආයතනයේ යම් දේපළකට අදාළ වන්නා වූ හෝ සම්බන්ධකමක් ඇත්තා වූ සියලු පොත්, ගිණුම් සහ ලේඛන ද

අදහස් වේ.

(2) (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොවන පරිදි—

(අ) රාජ්‍යය සතු වූ සහ සංස්ථාගත කිරීමේ නියමය අදාළ වන ව්‍යාපාර ආයතනයේ කාර්ය සඳහා අදාළ දිනයට පෙරාතුවම වූ දිනයෙහි ප්‍රයෝජනයට ගත් චංචල හෝ නිශ්චල සියලු දේපළ, අදාළ දිනයේ සිට, සංස්ථාගත කිරීමේ නියමයෙන් පිහිටුවන ලද සංස්ථාව වෙත සතු විය යුතු ය :

(ආ) අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැතියා වූ ඒ ව්‍යාපාර ආයතනයේ සියලු බැරකම්, අදාළ දිනයේ සිට, ඒ සංස්ථාවේ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඇ) සංස්ථාව විසින්, සේවා නියුක්තිය පිරිනමනු නොලැබුවා වූ හෝ එවැනි යම් සේවා නියුක්තිය පිරිනැමීමක් බාර නොගන්නා වූ, අදාළ දිනයට පෙරාතුවම වූ දිනයෙහි ඒ ව්‍යාපාර ආයතනයේ සිටි සියලු නිලධරයන් සහ සේවකයන්. අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වන්දි සහ පාරිතෝෂික ගෙවීම් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය ;

(ඈ) අදාළ දිනයට පෙරාතුවම වූ දිනයෙහි පැවැතියා වූ ඒ ව්‍යාපාර ආයතනයේ කාර්ය සඳහා ඇතුළත් වූ සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් අදාළ දිනයේ සිට සංස්ථාව විසින් ඇතුළත් වූ කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඉ) ඒ ව්‍යාපාර ආයතනය විසින් හෝ, ඒ ව්‍යාපාර ආයතනය නියෝජනය කරන්නා වශයෙන් නීතිපතිවරයා විසින් හෝ එපරිදිම ඒ ව්‍යාපාර ආයතනයට නැතහොත් නීතිපතිවරයාට විරුද්ධව හෝ පවරනු ලැබ ඇති සහ අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි නිම කරනු නොලැබ පැවැතියා වූ සියලු නඩු සහ නඩු කටයුතු අදාළ දිනයේ සිට ඒ සංස්ථාව විසින් හෝ ඒ සංස්ථාවට විරුද්ධව හෝ පවරන ලද නඩු හෝ නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා දිගටම පවත්වා ගෙන යාම සහ බලාත්මක කිරීම කරනු ලැබිය හැකිය.

4. (1) අමාත්‍යවරයා විසින් (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් පත් කරනු ලැබිය යුතු අතර, ඒ සාමාජිකයන්ගෙන් එක් තැනැත්තකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලය

(2) මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් එක් තැනැත්තකු, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබූ අයකු විය යුතු ය.

(3) සාමාජිකයා විසින් කලින් ධුරය අත්හරින්නේ නම් මිස, මණ්ඩලයේ සාමාජිකයකු විසින් අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු වන්නේ ය.

(4) අමාත්‍යවරයා විසින් එසේ කිරීම උචිත යයි කල්පනා කරන්නේ නම් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මණ්ඩලයේ යම් සාමාජිකයකු, එසේ ඉවත් කිරීම සඳහා යම් හේතුවක් නොදක්වාම, ඉවත් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරන ලද සාමාජිකයා ඒ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මිස ඉවත් කරනු නොලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා ඇමතූ ලිඛිත සංදේශයක් මගින් සාමාජිකයකුට සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා සාමාජිකයකු විසින් සිය ධුරය හිස් කරන ලද විට, ඒ ස්ථානය ගැනීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එසේ පත් කරන ලද යම් තැනැත්තකු තමා අනුප්‍රාප්තිකයා වූ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(7) යම් සාමාජිකයකු රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(8) මණ්ඩලයේ සාමාජිකයන්හට, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිර්ණය කරනු ලබන නියම සහ කොන්දේසි අනුව, පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(9) සභාපතිවරයා රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් සභාපතිවරයා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා මණ්ඩලයේ සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(10) මේ පනතේ සහ සංස්ථාගත කිරීමේ නියමයේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සහ ඒ රැස්වීම්වල දී වැඩ කටයුතු කරගෙන යාම පිළිබඳ රීති මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි ය.

(11) සංස්ථාව විසින් ලබා ගැනීමට හෝ කිරීමට යෝජිත යම් ණයක් හෝ කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් කෙළින් ම හෝ අන්‍යාකාරයෙන් සම්බන්ධතාවක් දක්වන සාමාජිකයකු විසින් තමාගේ ඒ සම්බන්ධතාවයේ ස්වභාවය මණ්ඩලයේ රැස්වීමේ දී අනාවරණය කළ යුතු ය. ඒ අනාවරණය කිරීම, ඒ රැස්වීමේ වාර්තාවෙහි වාර්තාගත කළ යුතු අතර, ඒ ණය මුදල හෝ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් වූ යම් සාකච්ඡාවකට හෝ තීරණය කිරීමකට ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු ය.

(12) සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් හෝ සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ තීරණයක් අවලංගු නොවිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

5. (1) සංස්ථාවට පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එය මණ්ඩලය භාරයේ තිබිය යුතු ය.

(2) සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට තබනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ මුද්‍රාව, මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරියේ හැර කිසියම් සාධන පත්‍රයකට හෝ ලියවිල්ලකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඒ දෙදෙනාම ඒ සාධන පත්‍රයට හෝ ලියවිල්ලට අත්සන් තැබිය යුතු ය.

(4) සංස්ථාවේ මුද්‍රාව තබනු ලැබූ සාධන පත්‍රවල හෝ ලියවිලිවල ලේඛනයක් මණ්ඩලය විසින් තබාගත යුතු ය.

6. කලින් කල, අමාත්‍යවරයා විසින් මණ්ඩලය විමසීමෙන් පසු, මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම පිණිස සහ කාර්ය ඉටු කිරීම පිණිස, මණ්ඩලය වෙත සාමාන්‍ය හෝ විශේෂ විධාන දෙනු ලැබිය හැකි අතර, එවැනි විධාන මණ්ඩලය විසින් ඉටු කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයාගේ විධාන.

7. (1) සංස්ථාවේ වැඩ කටයුතු සහ ව්‍යාපාරය පිළිබඳ සාමාන්‍ය අධීක්ෂණය, විධානය සහ පාලනය මණ්ඩලය සතු විය යුතු ය. මණ්ඩලයේ බලතල සහ කර්තව්‍ය.

(2) මණ්ඩලයේ මේ පනත යටතේ වූ කිසියම් බලතල, කාර්ය සහ කර්තව්‍ය සංස්ථාවේ සභාපතිවරයා වෙත, මණ්ඩලය විසින් පැවරිය හැකි ය.

(3) සංස්ථාගත කිරීමේ නියමයේ සඳහන් පරමාර්ථ ඉටු කිරීමේ දී ඒ සඳහා අවශ්‍ය වන්නා වූ හෝ ඉවහල් වන්නා වූ යම් දෙයක් කිරීම සඳහා මණ්ඩලයට බලය තිබිය යුතු අතර, ඒ කාර්යය සඳහා—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම සහ දැරීම හෝ කුලියට හෝ බද්දට ගැනීම සහ එවැනි යම් දේපළක් කුලියට හෝ බද්දට දීම හෝ විකිණීම නැත හොත් අන්‍යාකාරයෙන් බැහැර කිරීම කළ හැකි ය :

එසේ වුවද සංස්ථාව සතු කරනු ලැබූ නිශ්චල දේපළක් අමාත්‍යවරයාගේ පූර්ව අනුමතිය නොමැතිව විකිණිය නො යුතු ය.

(ආ) මුදලින් හෝ ද්‍රව්‍යයෙන් ප්‍රදානයන්, ත්‍යාග හෝ පරිත්‍යාගයන් භාරගත හැකි ය ;

(ඇ) එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් ණයට ගැනීම සහ එහි යම් දේපළක් උකසට තැබීමෙන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම් එකතු කිරීම කරනු ලැබිය හැකි ය ;

(ඈ) එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහ එහි කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් පත් කරගනු ලැබිය හැකි ය ;

(ඉ) එහි කාර්ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම් වලට ඇතුළත් වීම සහ ඉටුකිරීම කළ හැකි ය :

(ඊ) එහි බලතල, ක්‍රියාත්මක කිරීම, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා ආනුෂංගික වන්නා වූ හෝ ඉවහල් වන්නා වූ හෝ ඊට සම්බන්ධ වන්නා වූ වෙනත් සියලු ක්‍රියා කරනු ලැබිය හැකි ය.

**සංස්ථාවේ ප්‍රාග්ධනය.**

8. සංස්ථාවේ ප්‍රාග්ධනය, සංස්ථාගත කිරීමේ නියමයේ නිශ්චිතවම සඳහන් කරන ලද මුදල විය යුතු අතර පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් එය කලින් කල වැඩි කරනු ලැබිය හැකි ය.

**සංස්ථාවේ බැරකම්.**

9. සංස්ථාවේ බැරකම් සංස්ථාවේ ප්‍රාග්ධනයට සීමා විය යුතු ය.

**ආණ්ඩුව විසින් සංස්ථාවේ කොටස් දැරිය යුතු බව.**

10. මණ්ඩලය විසින්, ප්‍රාග්ධනයේ අගයට සමාන වූ මුළුමනින් ගෙවා නිමි කොටස් ප්‍රමාණයක් භාණ්ඩාගාරයේ ලේකම්ට (ඔහුගේ නිල තත්වයෙන්) වෙන්කර දිය යුතු අතර, ඔහු විසින් ඒ කොටස් රජය සඳහා සහ ඒ වෙනුවෙන් දැරිය යුතු ය.

**1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළ කිරීම.**

11. සංස්ථාවේ මුදල් පාලනය සම්බන්ධයෙන් 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

**මුදල් වර්ෂය සහ සංස්ථාවේ විගණනය.**

12. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාවේ ආදායම හා වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට සංස්ථාව විසින් සලස්වනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් විගණනය කිරීමේ ලා, රාජ්‍ය සංස්ථාවන්හි ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය.

**ප්‍රධාන මුදල් කළමනාකරු විසින් මූල්‍ය විශ්ලේෂණයක් ඉදිරිපත් කළ යුතු බව.**

13. ප්‍රධාන මුදල් කළමනාකරු විසින්, එවැනි වියදම්වල සියලු මූල්‍ය ගැටළු පෙන්වා දෙන මූල්‍ය විශ්ලේෂණයක් ඉදිරිපත් කර ඇත්තේ නම් මිස, මණ්ඩලය විසින්, රුපියල් මිලියන දෙකකට අඩු නොවන ගිණුම් සම්බන්ධයෙන්, මූල්‍ය ස්වභාවයේ තීරණයක් ගනු නොලැබිය යුතු ය.

**නිලධරයන් සේවකයන් සහ අනුයෝජිතයන් පත් කිරීම.**

14. (1) මණ්ඩලයේ බලතල කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන නිලධර යන්ට, සේවකයන්ට සහ අනුයෝජිතයන්ට, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ ප්‍රමාණයන් අනුව පාරිශ්‍රමික යන් ගෙවනු ලැබිය යුතු අතර, ඒ නිලධරයන්, සේවකයන් හා අනුයෝජිතයන්, එය විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(3) මණ්ඩලයේ ඉල්ලීම පරිදි, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේ ද, රාජ්‍ය පරිපාලනය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් ඒ හා සමාන කැමැත්තක් ඇතිව, තීරණය කරනු ලැබිය හැකි යම් කාලයක් සඳහා සංස්ථාවේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලැබීම හෝ ඒ හා සමාන කැමැත්තක් ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීම හෝ කළ හැකි ය.

(4) රජයේ සේවයේ යම් නිලධරයකු මෙම සංස්ථාවේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහු වෙත හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(5) රජයේ සේවයේ යම් නිලධරයකු මෙම සංස්ථාවේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහු වෙත හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(6) නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් සංස්ථාවට සේවය කරනු ලබන යම් කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලැබූ සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

15. (1) සංස්ථාවේ කාර්ය සඳහා යම් රජයේ නිශ්චල දේපළක් අවශ්‍ය වූ අවස්ථාවක, රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ කරනු ලැබිය හැකි විශේෂ ප්‍රදානයක් හෝ එවැනි ඉඩමක් බද්දට දීම පිළිබඳ කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, සංස්ථාවට ඒ දේපළ විශේෂ ප්‍රදානය කිරීමෙන් හෝ බදු දීමෙන් සම්බන්ධයෙන් ඒ අනුව ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය. නිශ්චල හා චංචල දෙවර්ගයේම රජයේ දේපළ සංස්ථාවට ලබාදිය යුතු බව.

(2) සංස්ථාවේ කාර්යය සඳහා රජයේ යම් චංචල දේපළක් අවශ්‍ය වූ අවස්ථාවක අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඒ චංචල දේපළේ සන්තකය සහ භාවිතය සංස්ථාව වෙත පැවරීම සහ සතු කිරීම කරනු ලැබිය යුතු ය.

සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකෙන බව.

16. සංස්ථාවේ සියලුම නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට විරුද්ධව සිවිල් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

17. සංස්ථාවට විරුද්ධව පවරනු ලබන යම් නඩුවක් සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට විරුද්ධව කිසිම සිවිල් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

18. අල්ලස් පනතේ අර්ථානුකූලව මෙම සංස්ථාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දට ප්‍රථමයෙන් මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.